## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
## පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තු

1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මඟින් ස්ථාපිත කරනු ලැබූ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පවත්නා පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් භාරගනු ලැබේ.

1. **පර්යේෂණ සහකාර**
2. **තාක්ෂණික සහකාර ජාල දෘඪාංග**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**1.පර්යේෂණ සහකාර (MA2-2)**
**බාහිර අයදුම්කරුවන්**
**වෘත්තීය**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් පහට (5) නොඅඩු පර්යේෂණ කටයුතු ක්ෂේත්‍රයට අදාලාව සහතික පත්‍රයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**
**වෘත්තීය**
ඉහත සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

2. **තාක්ෂණික සහකාර ජාල දෘඪාංග (MA2-2)**
**බාහිර අයදුම්කරුවන්**
**වෘත්තීය**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් පහට (5) නොඅඩු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව සහතික පත්‍රයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**
**වෘත්තීය**
ඉහත සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** MA2-2 50,540-540x10-630x7-1080x4-1280x20-90270+ ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත දීමනා

2027.01.01 දින දක්වා සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා වැටුප MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුකූල විය යුතුය.

**වයස් සීමාව:**
වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරු සඳහා අදාළ වන පොදු කොන්දේසි:**

1. සෑම අයදුම්කරුවෙකුම
   - ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
   - තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය
   - ඉහළ සදාචාරාත්මක චරිතයක් තිබිය යුතුය.
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් හරහා තම අයදුම්පත එවිය යුතුය.
3. ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා අයදුම්පතේ සඳහන් කළ යුතුය.
4. අධ්‍යාපනික සහ අනෙකුත් සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය.
5. කෙටි ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

- ➢ තෝරාගත් අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. කාර්යාංශය විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) 15% ක් සහ සේවක භාර අරමුදලට (ETF) අමතර 3% ක් ලබා දෙනු ඇත.
- ➢ අනෙකුත් ප්‍රතිලාභ;
  - රෝහල් වෛද්‍ය රක්ෂණ ක්‍රමයට හිමිකම් ලැබීම
  - බාහිර රෝගී වෛද්‍ය බිල්පත් වල මුදල් ප්‍රතිපූර්ණයට හිමිකම් ඇත.
  - රජයේ අනුමත දීමනා.

අයදුම් කරන තනතුර අයදුම්පත අඩංගු කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, 2025.11.01 දින හෝ ඊට පෙර ලැබීමට ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**භූ විද්‍යා සමීක්සණ හා පතල් කාර්යාංශය**
**569, එපිටමුල්ල පාර,**
**පිටකෝට්ටේ.**